# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 දෙසැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.09.25** දින වේ.

**සටහන - මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 31 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 25 වන දින ප.ව. 9.00ට අවසන් වේ.**

මෙම විභාගය උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත, කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03.

(අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්කිරීම් බලධරයාට බලය ඇත.

*සටහන :-* මෙම බඳවා ගැනීම මගින් අධික පුරප්පාඩු ප්‍රතිශතයක් පවතින අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කොමිෂන් සභාවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන අතර මෙම තරග විභාගය සමත්ව පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයට රාජකාරි සඳහා වාර්තා කිරීමට බැඳී සිටී. පත්වීම් ලබා දීමෙන් අනතුරුව අනුයුක්ත කළ සේවා ස්ථානය සංශෝධනය සඳහා සිදු කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඉ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. 48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – රු. 82,800/- ක් වේ. පත්වීමක් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම

ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

06. සුදුසුකම් :

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.09.25 දින හෝ ඊට පෙර හා 1996.09.25 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඈ) සෑම අපේක්ෂකයකුම දේශයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

1. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව **එක්වරකදී** විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියලුම විෂයයන්ගෙන් **එකවර** සමත්ව තිබීම.

***සටහන -***

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යය වේ.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සමාන, වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබාගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබා දීම සඳහා අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ අධ්‍යාපන ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් තහවුරු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලැබේ.

***සැලකිය යුතුයි* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.09.25 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

07. දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :

දිස්ත්‍රික් නාමලේඛනය, උපලේඛනය - I ලෙස දක්වා ඇත. අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - I අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී නිවැරදිව සඳහන් කළ යුතු ය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරනු ලැබේ.

III. විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු

සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*සැලකිය යුතුයි* **- දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු සංඛ්‍යාව වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතු වේ.**

(*ආ*) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

III. ඔහු නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

*සටහන -*

1. ලිඛිත විභාගයෙන් තේරීපත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත් වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

   I. උප්පැන්න සහතිකය
   II. ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාමලේඛන
   III. ශිෂ්‍ය කාර්ය දර්ශනය

2. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයක නිරත වන බව සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.)

3. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 07(ආ) හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරාගත් පසු එය නැවත වෙනස් කළ නොහැක.

08. මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන්කෙරෙන පුරප්පාඩු සඳහා අයදුම් කර සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට අමතරව වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ද ඉදිරිපත් කරනු ලබන අතර වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ දී ආබාධිත අයදුම්කරුවකු නොවන බවට හෝ ආබාධිත පදනම යටතේ පත්වීමක් ලබාදීමට සුදුසුකම් නොලබන බවට නිර්දේශ කරන අයදුම්කරුවන් පත්වීමක් සඳහා සුදුසුකම් නොලබන බව සැලකිය යුතු වේ.

*සටහන -* මෙම විභාගය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන අනුව විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවකු හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී යම් විශේෂිත පහසුකමක් සැලකිය යුතු අයදුම්කරුවකු ඉදිරිපත් වන්නේ නම් ඒ බව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අනිවාර්යයෙන් සඳහන් කළ යුතු

අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත්, අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතු ය.**

09. විභාග පරිපාටිය :-

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | පැය 02 1/2 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | පැය 01 |

(01) භාෂා හැකියාව :

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(02) අභියෝග්‍යතාවය :

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

***සටහන :-*** රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) මෙම තරග විභාගය මඟින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඇ) විභාග ප්‍රතිඵල - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව මත, ලිඛිත විභාගයේ එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ඇත.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

i. අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

11. විභාග කොන්දේසි

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත **ඉංග්‍රීසි භාෂාවෙන්** සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදුකළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii.) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method/ Flex App)
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සටහන:*** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iii) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(iv) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(v) අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(vii) අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් ද දැනුවත් කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ix) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(x) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

12. විභාගයට ඇතුළත් කර ගැනීම :

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම

එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

*සටහන :-* **අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

13. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛනයක් පමණක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 19 වන දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

## උපලේඛනය - I

### දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

## උපලේඛනය - II
විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 01 | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |
| | | හැව්ලොක් ටවුම | 06 |
| | | නුගේගොඩ | 07 |
| | | මොරටුව | 08 |
| | | පිළියන්දල | 09 |
| | | හෝමාගම | 10 |
| | | මහරගම | 11 |
| | | හංවැල්ල | 12 |
| | | අවිස්සාවේල්ල | 13 |
| 02 | ගම්පහ | මීගමුව | 14 |
| | | මිනුවන්ගොඩ | 15 |
| | | දිවුලපිටිය | 16 |
| | | වේයන්ගොඩ | 17 |
| | | ගම්පහ | 18 |
| | | ජාඇල | 19 |
| | | වත්තල | 20 |
| | | කැලණිය | 21 |
| | | දොම්පෙ | 22 |
| 03 | කළුතර | හොරණ | 23 |
| | | පානදුර | 24 |
| | | කළුතර | 25 |
| | | මතුගම | 26 |
| | | අලුත්ගම | 27 |
| 04 | මහනුවර | මහනුවර | 32 |
| | | කටුගස්තොට | 33 |
| | | තෙල්දෙණිය | 34 |
| | | වත්තේගම | 35 |
| | | නුගවෙල | 36 |
| | | ගලගෙදර | 37 |
| | | ගම්පොළ | 38 |
| 05 | මාතලේ | මාතලේ | 28 |
| | | ගලේවෙල | 29 |
| | | නාඋල | 30 |
| | | ලග්ගල - පල්ලේගම | 31 |
| 06 | නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | | නුවරඑළිය | 40 |
| | | වතුමුල්ල | 41 |
| | | හැටන් | 42 |
| | | ගිනිගත්හේන | 43 |
| 07 | ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | | ගාල්ල | 45 |
| | | බද්දේගම | 46 |
| 08 | මාතර | වැලිගම | 47 |
| | | මාතර | 48 |
| | | කඹුරුපිටිය | 49 |
| | | හක්මන | 50 |
| | | දෙයියන්දර | 51 |
| | | දික්වැල්ල | 52 |
| | | අකුරැස්ස | 53 |
| | | කොටපොල | 54 |
| 09 | හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | | වලස්මුල්ල | 56 |
| | | වීරකැටිය | 57 |
| | | තංගල්ල | 58 |
| | | අම්බලන්තොට | 59 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | හම්බන්තොට | 60 |
| | | තිස්සමහාරාමය | 61 |
| 10 | යාපනය | චාවකච්චේරිය | 62 |
| | | යාපනය | 63 |
| | | තෙලිප්පල්ලෙයි | 64 |
| | | පේදුරුතුඩුව | 65 |
| 11 | මන්නාරම | මන්නාරම | 66 |
| | | මුරුක්කන් | 67 |
| 12 | වවුනියාව | වවුනියාව | 69 |
| 13 | මුලතිව් | මුලතිව් | 68 |
| 14 | කිලිනොච්චිය | කිලිනොච්චිය | 124 |
| | | පලෙයි | 125 |
| 15 | මඩකලපුව | මඩකලපුව | 75 |
| | | එරාවූර් | 76 |
| | | කාතන්කුඩි | 77 |
| 16 | අම්පාර | අම්පාර | 78 |
| | | සේරංකඩ | 79 |
| | | කල්මුණේ | 80 |
| | | අක්කරපත්තු | 81 |
| | | සමන්තුරේ | 82 |
| 17 | ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | | ත්‍රිකුණාමලය | 71 |
| | | මුතූර් | 72 |
| | | පදවි පරාක්‍රමපුර | 73 |
| | | කින්නියා | 74 |
| 18 | කුරුණෑගල | කුලියාපිටිය | 87 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | බිංගිරිය | 88 |
| | | නාරම්මල | 89 |
| | | පොල්ගහවෙල | 90 |
| | | කුරුණෑගල | 91 |
| | | ඉබ්බාගමුව | 92 |
| | | දොඩම්ගස්ලන්ද | 93 |
| | | මොරතිහ | 94 |
| | | නිකවැරටිය | 95 |
| | | මහව | 96 |
| 19 | පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | | මාදම්පෙ | 84 |
| | | හලාවත | 85 |
| | | පුත්තලම | 86 |
| 20 | අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | | කැකිරාව | 98 |
| | | අනුරාධපුරය | 99 |
| | | ගලෙන්බිඳුණුවැව | 100 |
| | | කහටගස්දිගිලිය | 101 |
| 21 | පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | | හිඟුරක්ගොඩ | 103 |
| 22 | බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | | වැලිමඩ | 105 |
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |
| 23 | මොනරාගල | බිබිල | 111 |
| | | මොනරාගල | 112 |
| | | වැල්ලවාය | 113 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 24 | රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | | රත්නපුර | 119 |
| | | පැල්මඩුල්ල | 120 |
| | | බලංගොඩ | 121 |
| | | කලවාන | 122 |
| | | ඇඹිලිපිටිය | 123 |
| 25 | කෑගල්ල | කෑගල්ල | 114 |
| | | රඹුක්කන | 115 |
| | | මාවනැල්ල | 116 |
| | | රුවන්වැල්ල | 117 |

08 - 308

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

1.0 කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026 සැප්තැම්බර් මස 25** දින වේ. මෙම විභාගය **දෙසැම්බර්** මස පැවැත්වේ.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

*සටහන.-* **මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 25 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

2.0 මෙම තරග විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නේ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සඳහා පමණි. මෙම විභාගය පැවැත්වීමට අපේක්ෂිත නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| කොළඹ | 01 | කිලිනොච්චිය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මහනුවර | 04 | ත්‍රිකුණාමලය | 17 |
| මාතලේ | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | පුත්තලම | 19 |
| ගාල්ල | 07 | අනුරාධපුරය | 20 |
| මාතර | 08 | පොළොන්නරුව | 21 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 22 |
| යාපනය | 10 | මොනරාගල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| වවුනියාව | 12 | කෑගල්ල | 25 |
| මුලතිව් | 13 | | |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති

උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

4.0 වැටුප:-

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය රු.48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – 82,800/- (MN 2-2025) වේ. පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

*සටහන.-* පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යොදන වැටුප් වැඩිවීමේ නීති රීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

5.0 **සේවා කොන්දේසි:-**

(i) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත් කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත් කිරීම් බලධරයාට බලය ඇත.

***සටහන.-*** මෙම බඳවා ගැනීම මඟින් අධික පුරප්පාඩු ප්‍රතිශතයක් පවතින අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/කොමිෂන් සභාවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන අතර මෙම තරග විභාගය සමත්ව පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයට රාජකාරි සඳහා වාර්තා කිරීමට බැඳී සිටී. පත්වීම් ලබා දීමෙන් අනතුරුව අනුයුක්ත කළ සේවා ස්ථානය සංශෝධනය සඳහා සිදු කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

(iii) මෙම විභාගයෙන් සාමර්ථ්‍ය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ශ්‍රී ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(v) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(vi) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**6.0** **යෝග්‍යතාව :-**

රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන්ට පමණක් මෙම තරග විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

*සටහන :-* **පළාත් රාජ්‍ය සේවාවල නිලධාරින්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා අවසර නොමැත.**

මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම උක්ත සඳහන් සුදුසුකමට අමතරව,

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනකදී** භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හය(06)කට නොඅඩුව සම්මාන සාමර්ථ දෙකක් (02) සහිතව සමත් වී තිබිය යුතු ය.

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iv) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026 සැප්තැම්බර් 25 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.**

*සටහන :-*

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතු ය.

3. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදසුන් වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයන් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

   එසේම මෙම කරුණට අදාළව යම් සේවකයකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරන විමසීමකදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වාභාවය හා කාල සීමාව ද සඳහන් කළ යුතු ය.

**4. රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයන්, මණ්ඩල, සංස්ථා හා එවැනි අංශවල සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත.**

**5. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ සේවකයන්ට හැර එම දෙපාර්තමේන්තුවේ ඉහත 3 හි සඳහන් අයුරින් පුහුණුවක් ලබා දී ඇති**

**කිසිදු සේවකයකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.**

6. **මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සෑහීමට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේ දී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම ලැබීමට නුසුදුස්සෝ වෙති.**

**7.0** විභාග කොන්දේසි:-

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

(ii) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) විභාග ගාස්තුව රු. 600කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method/Flex App)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

*සටහන:* ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iv) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(v) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(vi) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය.

*සටහන:* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන දින විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vii) මෙම විභාගය සඳහා **විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්** ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.

(viii) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත්

භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.0 පත්කිරීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

9.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.- විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**11.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-** ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**12.0 විභාග පරිපාටිය සහ පත්වීම සඳහා තෝරාගනු ලබන ආකාරය :-**

විභාග විෂයය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ :

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 | *පැය 02 1/2* |
| අභියෝග්‍යතාවය | 100 | 40 | *පැය 01* |

සෑම ලිඛිත පිළිතුරු පතක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. පත්වීමක් සඳහා තෝරා ගැනීමට අයදුම්කරුවකු විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%ක්) ලබාගත යුතු වේ.

මෙම තරග විභාගයට අදාළව පුරප්පාඩු ගණනය කරන දිනට සේවයේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් සේවා ව්‍යවස්ථානුකූලව

30%ක පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් ලිඛිත විභාගයෙන් අත්කරගනු ලබන ලකුණු පදනම් කරගත් කුසලතා අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. උක්ත ඡේදයේ සඳහන් සීමිත තරග විභාගයේ ***අවම සමත් ලකුණු ප්‍රමාණය අත්කරගත් පමණින් කිසිදු අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට හෝ පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් නොලබන බව අවධාරණය කරනු ලැබේ.***

**13.0 විෂයය නිර්දේශය : -**

**භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ යෝග්‍යතා පරීක්ෂණය: (කාලය පැය $2^{1/2}$ යි)**

අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සේවා නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරින්ගේ රාජකාරි පිළිබඳව අපේක්ෂක/අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

I වන කොටස - භාෂා හැකියාව මැනෙන ආකාරයේ අවබෝධය හා සම්බන්ධ ව්‍යුහගත ප්‍රශ්න, සාරාංශ කොට ලිවීම සහ රචනය (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

II වන කොටස - කළමනාකරණ සේවා නිලධාරි සේවයට යෝග්‍යතාව මැනෙන සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් ගොඩනැගෙන කෙටි ප්‍රශ්න, ව්‍යුහගත ප්‍රශ්න සහ රචනා වර්ගයේ ප්‍රශ්න (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

**අභියෝග්‍යතාව (කාලය පැය 01)**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න සහ කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50යි (කාලය පැය 01) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

14.0 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 19 වන දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 309

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහයක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුරේ පුරප්පාඩු 80 ක් පිරවීම සඳහා 2026.09.28 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.09.28 වේ. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම් පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී